සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

## දෙවන වාර පරීක්ෂණය - 8 ශ්‍රේණිය - 2017
## Second Term Test - Grade 8 - 2017

**නම : ..............................................** **නාට්‍ය හා රංග කලාව** **කාලය : පැය 02 යි.**

## I කොටස

g **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

g **පහත ප්‍රකාශවල හරි නම් (3) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.**

(1) රංග විධාන නාට්‍ය පෙළකට අත්‍යාවශ්‍ය අංගයක් නො වේ. ( )

(2) පරිකල්පනය යනු කිසියම් චරිතයකට ප්‍රවිශ්ට වීමයි. ( )

(3) වේෂ භූෂණ අයත් වන්නේ අනුෂාංගික කලාවන්ට ය. ( )

(4) ස්වසන අභ්‍යාස කිරීමෙන් කටහඬ භාවිතය දියුණු වේ. ( )

(5) ''ගස් දෙකේ යුද්ධය'' රංග අභ්‍යාසයකි. ( )

g **පහත දැක්වෙන ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(6) 'තොප්පි වෙළෙන්දා' නාට්‍ය යේ නිෂ්පාදක වන්නේ,
(i) නන්දන අලගියවන්න (ii) සෝමලතා සුබසිංහ
(iii) අමිතා රබ්බිඩිගල (iv) පාලිත ලොකුපෝතාගම

(7) ''අභිනය'' පිළිබඳ මුල් වරට ප්‍රකාශ කරනු ලැබුවේ,
(i) ඇරිස්ටෝටල් විසිනි. (ii) ධනංජය විසිනි.
(iii) භරතමුණි විසිනි. (iv) අභිනව ගුප්ත විසිනි.

(8) රංග අභ්‍යාසයක් නොවන්නේ,
(i) හිම කන්ද දිය වීම. (ii) ක්‍රමානුකූලව හුස්ම ගැනීම හා පිට කිරීම.
(iii) බාධක සහිත ගමනක යෙදීම. (iv) අංකවලට එකතු වීම.

(9) ජන ගී ගායනය තුළින් ලැබෙන ප්‍රයෝජනයක් නොවන්නේ,
(i) කට හඬ තීව්‍ර වීම. (ii) හැඟීම් ප්‍රකාශනය දියුණු වීම.
(iii) හඬ පැහැදිලි වීම. (iv) පුළුල් පරාසයක හඬ විහිදී යාම

(10) ''නාට්‍ය පෙළක ඇතුළත් විය යුතු අංගයක් නොවන්නේ,
(i) චරිත (ii) සංවාද
(iii) කතුහලය (iv) අභිනය

g **හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා ලියන්න.**

(බුද්ධ ගජ්ජය, සිරිත් මල් දම, යාතු කර්ම, අනුෂාංගික කලා, නාට්‍යෝපකරණ)

(11) 'නරිබෑණා' නාට්‍යයේ කපුවාගේ බස්තම අයත් වන්නේ .......................................... වලටය.

(12) .......................................... කියැවීම තුළින් කටහඬ දියුණු කර ගත හැක.

(13) නාට්‍යයක පසුතලය අයත් වන්නේ .......................................... වලටය.

(14) කට හඬ තීව්‍ර කර ගැනීම සඳහා .......................................... ගී ගායනය වැදගත් වේ.

(15) .......................................... කියැවීම නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය කිරීමේ දී වැදගත් වේ.

g A සහ B **යන තීරු නිවැරදි ලෙස යා කරන්න.**

| | A | B |
|---|---|---|
| (16) | අමර ගියා දිව්‍ය ලෝකේ | සෝමලතා සුබසිංහ |
| (17) | කදා වළලු | පාලිත ලොකුපෝතාගම |
| (18) | හිම කුමාරි | ටයිටස් තොටවත්ත |
| (19) | හඳයා | එදිරිවීර සරච්චන්ද්‍ර |
| (20) | සිරි රජ සිරි | සෝමරත්න දිසානායක |

මුළු ලකුණු (2 x 20 = 40)

# II කොටස

g **පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ. පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 03කට පිළිතුරු සපයන්න.**

(01)

A

කැලේ හරිම ලස්සනයි
දිය ඇලි හිමිහිට ගලයි
මල් පිපිලා සුවඳ දෙයි
ගෙඩි ඉදිලා සතුට දෙයි

B

මිදුල පෙනෙයි
ගෙදර ළඟයි
මහන්සියෙන්
හති හලමින්

C

රොන් මැස්සෝ රොන් ගෙනෙතී
මුර මැස්සෝ මුර කරතී
සෙසු මැස්සෝ වඳ හදතී
එකමුතු වී වැඩ කරතී

(i) ඉහත කවි ඇතුළත් වන නාට්‍යයේ නම කුමක් ද? (ලකුණු 1)

(ii) එම නාට්‍යයේ නිෂ්පාදකයා නම් කරන්න. (ලකුණු 1)

(iii) ඉහත කවි තුන නාට්‍යයේ කියනු ලබන්නේ කවුරුන් විසින් ද යන්න වෙන් වෙන් වශයෙන් අක්ෂර ඉදිරියෙන් ලියා දක්වන්න. (ලකුණු 3)

(iv) මෙම නාට්‍යයට අනුව මී මැස්සන්ගේ කාර්යයන් ලියා දක්වන්න. (ලකුණු 2)

(v) ඉහත කවි ඇතුළත් නාට්‍යයෙන් දෙනු ලබන පණිවිඩ 03ක් ලියා දක්වන්න. (ලකුණු 3)

(02) (i) 'අභිනය' යනු කුමක් ද? හඳුන්වන්න. (ලකුණු 2)

(ii) අභිනයේ ප්‍රභේද නම් කර එක් එක් ප්‍රභේදය පැහැදිලි කරන්න. (ලකුණු 4)

(iii) ඔබ දැක ඇති ජනප්‍රිය නාට්‍යයක සතර අභිනය භාවිත කර ඇති ආකාරය විස්තර කරන්න. (ලකුණු 4)

(03) (i) 'නළු වරණය' යනු කුමක් ද? හඳුන්වන්න. (ලකුණු 2)

(ii) නළුවරණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු 04ක් ලියන්න. (ලකුණු 4)

(iii) ඔබ දැක ඇති ජනප්‍රිය නාට්‍යයක චරිත 04ක් නම් කොට එකී චරිතවල චරිත ලක්ෂණ වෙන් වෙන් වශයෙන් ලියා දක්වන්න. (ලකුණු 4)

(04) (i) 'නාට්‍යයක තේමාව' යනු කුමක් ද? හඳුන්වන්න. (ලකුණු 2)

(ii) නාට්‍ය නිර්මාණය සඳහා සුදුසු තේමාවන් 03ක් ලියා දක්වන්න. (ලකුණු 3)

(iii) ඔබ ලියන ලද එක් තේමාවකට අනුකූල වන සේ නාට්‍යෝචිත කතන්දරයක් නිර්මාණය කර ලියා දක්වන්න. (ලකුණු 5)

(05) (i) ආගමික නාට්‍ය යනු මොනවා ද? කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 2)

(ii) ශ්‍රී ලංකාවේ දනට නිර්මාණය වී ඇති ජනප්‍රිය ආගමික නාට්‍ය 3ක් නම් කරන්න. (ලකුණු 3)

(iii) ආගමික නාට්‍ය නිර්මාණය කිරීම තුළින් ලැබෙන ප්‍රයෝජන 05ක් ලියා දක්වන්න. (ලකුණු 5)

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

දෙවන වාර පරීක්ෂණය - 8 ශ්‍රේණිය - 2017

**Second Term Test - Grade 8 - 2017**

නාට්‍ය හා රංග කලාව - පිළිතුරු පත්‍රය

## I කොටස

(1) - (x)
(2) - (x)
(3) - (3)
(4) - (3)
(5) - (x)
(6) - (ii)
(7) - (iii)
(8) - (iv)
(9) - (ii)
(10) - (iv)
(11) - නාට්‍යෝපකරණ
(12) - බුද්ධ ගජ්ජය
(13) - අනුෂාංගික කලා
(14) - ජන ගී
(15) - සිරිත් මල් දම
(16) - පාලිත ලොකුපෝතාගම
(17) - එදිරිවීර සරච්චන්ද්‍ර
(18) - සෝමලතා සුබසිංහ
(19) - ටයිටස් තොටවත්ත
(20) - සෝමරත්න දිසානායක

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

(01) (i) වලහා සහ මාෂා (ලකුණු 1)

(ii) ඩී. කුමාරගේ (ලකුණු 1 )

(iii) A - මාෂා B - වලහා C - මාෂා (ලකුණු 3 )

(iv) රොන් ගෙන ඒම, මුර කිරීම, වද සෑදීම, එකමුතුව වැඩ කිරීම, මල් සෙවීම, පැණි සෑදීම (ලකුණු 2 )

(v) අවිහිංසාවාදී බව, වයසට සරිලන ලෙස විවිධ හැකියාවන් තිබිය යුතු බව, උපක්‍රමශීලී වීම, පිළිවෙළකට වැඩ කළ යුතු බව, අන් සතු දේ සොරා නොගෙන යුතු බව, නරක අය පවා යහපත් ආශ්‍රයෙන් යහපත් වන බව
(ලකුණු 3 )

(02) (i) ''රූප පෙළක් ඉදිරියට ගෙන ඒම'' ප්‍රභේද 04කි. නාට්‍ය ශාස්ත්‍රයේ භරතමුණි විසින් මුල්වරට මේ පිළිබඳ කරුණු දක්වා ඇත. (ලකුණු 2)

(ii) ආංගික අභිනය, සාත්වික අභිනය, වාචික අභිනය, ආහාර්ය අභිනය

ආංගික අභිනය - ශරීරයේ අත් පා ආදී අංග චලනය තුළින් කිසියම් අදහසක් ප්‍රකාශ කිරීම.

සාත්වික අභිනය - මුහුණේ හැඟීම් ප්‍රකාශනය මඟින් කිසියම් අදහසක් ප්‍රකාශ කිරීම

වාචික අභිනය - වචන භාවිතා කරමින් කිසියම් අදහසක් ප්‍රකාශ කිරීම, ගද්‍ය, පද්‍ය, ගීත ආශ්‍රයෙන් මෙසේ අදහස් ප්‍රකාශ කළ හැක.

ආහාර්ය අභිනය - රංග භූමියට බැහැරින් එක් වන සියලු ම කලාවන් ආහාර්යය අභිනයට අයත් වේ. පසුතල, රංගාලෝකය, සංගීතය, අංග රචනය, වේෂභූෂණ ආදිය ආහාර්ය අභිනයට අයත් වේ. (ලකුණු 4 )

(iii) අවශ්‍ය කරුණු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 4)

(03) (i) නාට්‍යයක් නිර්මාණය කිරීමේ දී අදාළ චරිතයන්ට උචිත ලෙස නළු නිළියන් තේරා ගැනීම නළු වරණයයි. (ලකුණු 2 )

(ii) රංගන හැකියාව, ගායන හැකියාව, පෞරුෂය, බාහිර පෙනුම, පෙර කරන ලද චරිත පිළිබඳව, ක්ෂණිකව හැඩ ගැසීම, කැපවීම. (ලකුණු 4 )

(iii) ජනප්‍රිය නාට්‍යයක් නම් කොට චරිත 4ක චරිත ලක්ෂණ ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 4)

(04) (i) නාට්‍යකින් මතු වන ප්‍රධාන අදහස හෝ අදහස්. ඕනෑම නාට්‍යයකට තේමාවක් තිබිය යුතු වේ. (ලකුණු 2 )

(ii) අදාළ තේමාවන් 03ක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 3)

(iii) නිර්මාණාත්මකව කතන්දරය ගොඩ නැඟීම, තේමාවට අනුකූල වීම යන කරුණු සලකා ලකුණු ලබා දෙන්න. (ලකුණු 5)

(05) (i) කිසියම් ආගමකට අයත් කතාවක් හෝ පණිවිඩයක් හෝ අදහසක් පදනම් කරගෙන බිහි වූ නාට්‍යය ආගමික නාට්‍ය වේ. (ලකුණු 2 )

(ii) වෙස්සන්තර, ලෝමහංස, බව කඩතුරාව, සිරිසඟ බෝ, සාන්තුවර සෙබලාණෝ, කඳා වළලු, මහාසාර,සද්දන්ත , කුස පබාවතී ආදී ලෙස නාට්‍ය 03ක් නම් කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(ලකුණු 3 )

(iii) සාරධර්ම ගොඩනඟා ගැනීම, යුගයේ සංස්කෘතික ලක්ෂණ අවබෝධ කර ගත හැකි වීම, සමකාලීන සමාජය යහපත් කර ගැනීමට හැකි වීම, විද්‍යාත්මක වටිනාකමක් තිබීම, ආගම මිනිසුන් අතර ප්‍රචාරය කර ගැනීමට හැකි වීම, ආදී කාරුණු 05ක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 5 )